## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජනවාරි 2014

## (53) ව්‍යාපාර අධ්‍යයනය

(Business Studies)

---

මෙම ප්‍රශ්න පත්‍රය විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන පරිදි පිළියෙල කර තිබුණි. සමස්ථයක් වශයෙන් සලකා බලන විට මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ සාධන මට්ටම සතුටුදායක තත්ත්වයක පැවතුනි. එහෙත් සුළු අයදුම්කරුවන් පිරිසක් සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව පැහැදිලි විය. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වන්නේ සාර්ථකව ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් දැනුවත් කිරීමය. එක් එක් ප්‍රශ්නය වෙන් වශයෙන් ගෙන සලකා බැලීමේදී උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ අවධානයට ලක්වූ වැදගත් කරුණු පහත දැක්වේ.

## A - කොටස

### ප්‍රශ්න අංක 01 - ලකුණු 40

**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය අනු කොටස් 20 කින් යුක්ත බහුවරණ ප්‍රශ්නයකි. එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු ප්‍රමාණය 40 කි.

ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය සහ එයට අදාල ප්‍රායෝගික දැනුම බොහෝ දුරට ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නය සකසා තිබුණි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ පිළිතුරු සපයා ඇතත් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට බොහෝ දෙනෙකුට නොහැකි විය.

අනු අංක (N), (P), (R) සහ (T) යන කොටස් වලට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන් කිහිප දෙනෙක් පමණි. ඒ සම්බන්ධයෙන් උත්තර පත්‍ර නිරීක්ෂණයන් මෙසේය:

(N) අයදුම්කරුවන් තුල සාපේක්ෂ සහ නිරපේක්ෂ වාසි න්‍යාය පිළිබඳ මනා අවබෝධයක් නොතිබීම නිසා මෙම කොටසට නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ දෙනෙක් අසමත් විය.

(P) තීරුබදු සංගම් පිළිබඳ නිරවුල් අවබෝධයක් අයදුම්කරුවන් තුල නොමැති වීම.

(R) ගෙවුම් ශේෂ ලේඛනයේ එක් එක් ගිණුම් වලට අයත් වන හා නොවන අයිතමයන් පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම.

(T) පොදුරාජ්‍ය මණ්ඩල නායක සමුළුව සම්බන්ධ ප්‍රායෝගික දැනුම දුර්වල වීම නිසා මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන්ට නොහැකි විය.

## B කොටස

### ප්‍රශ්න අංක 02 - ලකුණු 15

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** (i) ශ්‍රම විභජනය යන සංකල්පය වැඩි අයදුම්කරුවන් පිරිසක් විසින් නිවැරදිව පැහැදිලි කර තිබූ අතර වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමටද ඔවුන්ට හැකි විය.

(ii) විශේෂීකරණය යනු කුමක්ද යන්න මැනවින් විග්‍රහ කර නියමිත ලකුණු වලින් වැඩි ප්‍රමාණයක් බොහෝ අයදුම්කරුවන් විසින් ලබාගෙන තිබුණි.

**(b)** හවුල් ව්‍යාපාරයකට බලපාන නීති හා රෙගුලාසි පිළිබඳ නිරවුල් අවබෝධයක් ඇතැම් අයදුම්කරුවන් තුල නොතිබූ බව පෙනී ගිය කරුණකි. එබැවින් බොහෝ අයදුම්කරුවන්ට මුළු ලකුණු ප්‍රමාණය ලබාගත නොහැකි විය.

**(c)** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ වගකීම් සීමිත සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියකියවිලි නිවැරදිව නම් කිරීමට අයදුම්කරුවන් බොහෝ දෙනෙකු සමත් විය.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සමන්විත වී ඇති ප්‍රධාන මූල්‍ය ආයතන කාණ්ඩ නිවැරදිව දැක්වීමට ඇතැම් අයදුම්කරුවන් අසමත් වී ඇත්තේ ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසාය. එහෙත් බොහෝ දෙනෙකු වැඩි ලකුණු ලබා ගැනීමට සමත් විය.

**(b)** බලපත්‍රලාභී වාණිජ බැංකුවක කාර්යයන් දැක්වීමටත්, බලපත්‍රලාභී බැංකු සඳහා උදාහරණ දැක්වීමටත් බොහෝ අයදුම්කරුවන් සමත් විය. ඇතැම් අයදුම්කරුවන් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට උදාහරණ ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව නම් කර තිබුණි.

**(c)** මූල්‍ය කල්බදුකරණය හා මෙහෙයුම් කල්බදුකරණය පිළිබඳ ඇති වෙනස්කම් නිවැරදිව දැක්වීමට බොහෝ අයදුම්කරුවන් අසමත් වී ඇත්තේ කල්බදු සම්බන්ධයෙන් ඔවුන් තුල ඇති අනවබෝධය නිසාය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් සපයන සේවාවන් මොනවාද යන්න සමහර අයදුම්කරුවන් නිවැරදිව අවබෝධ කරගෙන නොතිබුණි. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට "ආයෝජන මණ්ඩලය" මගින් යන කොටස අමතක කර සාමාන්‍ය සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීමට අදාල සාධක පමණක් සඳහන් කර තිබීම නිසා බහුතරයකට අඩු ලකුණු ප්‍රමාණයක් හිමි විය.

(b) ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දායකත්වය බොහෝ දෙනෙක් නිවැරදිව සටහන් කර මුළු ලකුණු ප්‍රමාණය ලබාගෙන තිබුණි.

(c) අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සපයනු ලබන ප්‍රධාන සේවා බොහෝ අයදුම්කරුවන් විසින් නිවැරදිව දැක්වීමට සමත් විය.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) "රක්ෂණය කිරීමෙන් ලාභ ඉපැයිය නොහැක" යන ප්‍රකාශය රක්ෂණ මූලධර්ම ඇසුරින් පැහැදිලි කරන ලෙස දක්වා ඇති මෙම ප්‍රශ්නයට නිවැරදි මූලධර්ම ගළපා ඇත්තේ අයදුම්කරුවන් සුළු ප්‍රමාණයකි.

(b) ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් හානි පූරණය කිරීම සඳහා භාවිත කරන ක්‍රම මොනවාද යන්න පිළිබඳව අයදුම්කරුවන් තුල පැහැදිලි අවබෝධයක් නොමැති බව ඔවුන් විසින් සපයා ඇති පිළිතුරු වලින් පෙනී යයි.

(c) මුහුදු රක්ෂණයේදී භාවිත කරන රක්ෂණ ඔප්පු වර්ග පැහැදිලි කිරීමට අයදුම්කරුවන් බොහෝ දෙනෙක් සමත් වී ඇති අතර ඒ සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීමටද ඔවුනට හැකි විය.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) සංඛ්‍යාත්මක නිදර්ශනයක් භාවිත කරමින් නිරපේක්ෂ වාසි න්‍යායේ සීමාවන් පැහැදිලි කරන ලෙස දක්වා ඇති මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඉදිරිපත්ව ඇත්තේ ඉතා ස්වල්ප අයදුම්කරුවන් පිරිසක් වන අතර ඔවුන් විසින් සපයා ඇති පිළිතුරු වලින්ද පෙනී ගියේ නිරපේක්ෂ වාසි න්‍යාය පිළිබඳව ඔවුන් තුළ ඇති දැනුම ඉතා දුර්වල මට්ටමක පවතින බවයි.

(b) ගෙවුම් ශේෂ සම්බන්ධයෙන් පහත දැක්වෙන සංකල්ප පැහැදිලි කරන ලෙස දක්වා ඇත:

(i) වර්තන ගිණුමේ ශේෂය: බොහෝ අයදුම්කරුවන් ගෙවුම් ශේෂ ලේඛනයේ වර්තන ගිණුම් ශේෂය වෙනුවට අයවැය ලේඛනයේ වර්තන ගිණුම පැහැදිලි කර තිබුණි.

(ii) සමස්ත ශේෂය: මෙම කොටසට පිළිතුරු සැපයූ බොහෝ අයදුම්කරුවන් සමස්ථ ශේෂය නිවැරදි ලෙස අර්ථ දැක්වීමට අසමත් වීම නිසා ලකුණු ලබා ගැනීමට අසමත් විය.

(c) විදේශ විනිමය අනුපාතිකය අධිතක්සේරු වීමක ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන ලෙස දක්වා ඇති මෙම කොටසට පිළිතුරු සපයා තිබුණේ ඉතා ස්වල්ප දෙනෙකි. සමහර අයදුම්කරුවන් විනිමය අනුපාතිකය ක්ෂය වූ විට ඇතිවන ප්‍රතිවිපාක දක්වා තිබුණි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

පහත සඳහන් දෑ සම්බන්ධව කෙටි සටහන් ලිවීමට තිබුණි. සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි. ඔවුන් අතුරෙන්ද (a), (d) සහ (e) යන කොටස් වලට පිළිතුරු සැපයීම සතුටුදායක මට්ටමක නොපැවතුණි. එහෙත් (b) සහ (c) යන කොටස් වලට ඉතා සතුටුදායක අන්දමින් පිළිතුරු සපය තිබුණි.

(a) <u>වාණිජ පත්‍රිකා</u>

මේ පිළිබඳව නිරවුල් අවබෝධයක් නොමැති නිසා බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුරු දක්වා තිබුණි.

(b) <u>වෙළෙඳ ශේෂය</u>

මෙම කොටස සඳහා අයදුම්කරුවන් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා වැඩි ලකුණු ලබාගෙන තිබුණි.

(c) <u>ලියවිලි සහිත ණයවර ලිපිය</u>

මෙම කොටසට පිළිතුරු සැපයූ බොහෝ අයදුම්කරුවන් ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීමට සමත් විය.

(d) <u>ඉදිරි විනිමය ගනුදෙනු</u>

අයදුම්කරුවන් බොහෝ දෙනෙක් තුළ මේ සම්බන්ධව කිසිම අවබෝධයක් නොමැති බව පැහැදිලි විය.

(e) <u>සමස්ත කොටස් දර්ශකය</u>

මෙම කොටසට පිළිතුරු සැපයීම බොහෝ අයදුම්කරුවන් අත්හැර දමා තිබූ අතර පිළිතුරු සැපයූවන්ද දක්වා තිබුණේ නොගැළපෙන වැරදි පිළිතුරුය.

## <u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

1. ප්‍රශ්න පත්‍රය ලබා ගත් වහාම ආරම්භයේ දී ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** හොඳින් සැලකිලිමත්ව කියවා අනිවාර්ය ප්‍රශ්න සහ තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය. ප්‍රශ්න පත්‍රයේම උත්තර ලියා අමුණා තැබීම නොකළ යුතුයි.

2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.

3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

4. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.

5. අත්අකුරු පැහැදිලිව ලිවීම මඟින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.

6. පසුගිය වසරවල විභාග ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් විෂය දැනුම වර්ධනය කර ගැනීමටත්, වේගවත්ව පිළිතුරු සැපයීමේ නිපුණතාව ඇතිකර ගැනීමටත් හැකියාව ලැබේ.

7. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.

8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -